සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**13 ශ්‍රේණිය** **සිංහල - I** **පිළිතුරු පත්‍රය**

(01) (අ) (1) පිරිසිදු ශීලය රැකගනිමින් / ශීලයෙන් පිරිසිදු වී
(2) සෝවාන් ඵලය ලබා ගැනීමෙන්
(3) තම දරුවන් ස්වාමියා, දෙමාපියන් හා සහෝදරයා මියයාම / බන්ධු සහායක් නොමැති වීම.
(4) ලෝකෝත්තර / පරලොව
අත්හැරියහ (ල.04)

(ආ) (1) ජම්බු නදියෙහි රනින් නිමවන ලද මුතු මැණික් දියමන්ති ඔබ්බවා තනා තිබීම.
(2) බිසව පෙර භවයේ ඇතින්නක ව හිඳ ඇත් රජුගේ සමාන බිරියන් කෙරේ දැක් වූ ඊර්ෂ්‍යාව නිසා ම ඇත් රජු කෙරේ ද්වේෂයෙන් පසු වීම හා ඇත්රජු මරා දැමීමට සිතීම.
(3) ජම්බු නදියේ රත්තරං වැනි රනින් නිමවන ලද
(4) ආධාර විභක්තිය (ල.04)

(ඉ) (1) ආරණ්‍යාවාසී අභය තෙරුන්ගෙන්
(2) අනිත් පයින් පහර දී අමු සොහොනට ගෙනගොස්, අලුත් මළ මිනියක් මුණින් අතට හරවා ඒ මත උඩුකුරු ව සොරාව දිගා කරවා මුදාගත නොහැකි ලෙසින් මළ මිනිය හා එක් කර බැඳ දැමීම.
(3) අද දින රාත්‍රියේ අමනුෂ්‍යයෙකු ගමට පැමිණෙන බවත්, ඔහුව නිවසට වැද්ද නොගන්නා ලෙසත් ගම්වැසියන්ට දැන්වීම.
(4) ඌර්ධ්වමුඛ
දිගාකරවා (ල.04)

(ඊ) (1) නිරතුරුව ම ලෝක සත්ත්වයා සනසමින් සෙත සැලසීම.
(2) හයක් වූ ගුණ
සතර පාද නමැති බිත්ති හතර
දසරාජධර්ම නමැති මැණික් කණු
තේජස හා ආඥාව නම් වූ මන්දිරය
(3) ජලය රජුගේ මහදානය
කිළුට දිළිඳු සිතේ බැඳි ආශාව
(4) සිනිඳු වූ කීර්තිය නම් වැල මනාව (බොහෝ සෙයින්) වර්ධනය කළේ ය.

(උ) (1) පන්සිය පනස් ජාතක පොතේ එන ගණ්ඩතින්දු ජාතකයේ එන්නකි. වෙස්වළාගෙන රට වටා ඇවිදින රජුට හා පුරෝහිතයාට මැඩියන් විසින් ප්‍රකාශ කරන්නකි.
(2) ශ්‍රී හර්ෂ දේවයන්ගේ රත්නාවලී නාට්‍යයේ එන්නකි. උදයන රජු විසින් වසන්තක වෙත පවසන ලද්දකි. සැලලිහිණියා මූණමල් ගස උඩ සිට ශබ්ද කරනු අසා පවසන්නකි.
(3) දෙවන ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්දර්මාලංකාරයෙහි සාලිරාජ වස්තුවෙහි එන්නකි. අසෝක ගස මුදුනේ සිටින අසෝකමාලාවගේ රුව වර්ණනා කිරීමෙන් අනතුරු ව සාලිය කුමරු අසෝක මාලාවගේ රුවෙන් වශී වී අගෙන් නහන පැනයකි.
(4) දඹදෙණි යුගයේ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ 'මච්ඡරිය කෝසිය සිටාණන්ගේ වස්තුව හි එන්නකි. උඩුමහලට ගොස් රහසින් කබලු පිස කෑමට ගිය සිටුතුමාට පෙනෙනසේ මුගලන් හිමි කවුළුදොරින් එපිට අහසේ සක්මන් කරන විට මුගලන් හිමිට කෝසිය සිටු පවසන්නකි.
(5) මාර්ටින් වික්‍රමසිංහගේ 'මුදියන්සේ මාමා' කෙටි කතාවෙන් එන්නකි. එහි එන ගුණසීල මුදියන්සේ විසින් මාලිනීට පවසන්නකි. මාලිනී බන්දේසියේ ගෙනා වැවර බී අවසානයේ පැවසුවකි.
(6) රංජිත් ධර්මකීර්තිගේ 'ප්‍රදීපාගාරය යට' කෙටිකතාවේ එන්නකි. එහි කථිකයා විසින් සමන්තිකාගෙන් ඇසුවකි. (ල. 2 × 4 = 8)

(ආ) යමුනා මාලිනී පෙරේරා කිවිඳියගේ 'සුරාසොඬ සැමිවලප' පද්‍ය පන්තියේ ආකෘතිය, අන්තර්ගතය, තේමාව, අනුභූතිය භාෂාත්මක ප්‍රයෝග ආදිය පිළිබඳ ව සිත් යොමු කරමින් රසාස්වාදය කර තිබීම අපේක්ෂිතයි.

(ලකුණු 16)

(02) පටාචාරා වස්තුවේත්, මච්ඡරිය කෝසිය සිටාණන්ගේ වස්තුවේත්, කතාසාරය ඇසුරෙන් මානව දයාවෙන් යුතු කතා කලාවක් සහිත ව රචනා කර තිබීම පිළිබඳ නිදසුන් සහිත ව විස්තර කිරීම අපේක්ෂිතයි. (ලකුණු 15)

නැතහොත්

සම්බුලා ජාතකය, ඡන්දන්ත ජාතකය, ගණ්ඩතින්ද ජාතකය ඇසුරින් නිදසුන් සහිත ව ලියා තිබීම අපේක්ෂිතයි.

(ලකුණු 15)

(03) වර්ණනා සාලිරජ වස්තුවේ එන වර්ණනා ද

ජීවිතාදර්ශ ආරඤ්ඤක අභය වස්තුවේ එන ආදර්ශ ද දැක්වමින් නිදසුන් සහිතව ලියා තිබීම අපේක්ෂිතයි.

(ලකුණු 15)

(04) ගිරා සන්දේශයේ එන දූතවර්ණනය, පුරවර්ණය, රාජවර්ණය, මඟ වැනුම්, වන වැනුම් ආදී වැනුම් වලින් දෙකක් නිදසුන් සහිත ව දක්වමින් ලියා තිබීම අපේක්ෂිතයි. (ලකුණු 15)

(05) අධ්‍යාත්මික ප්‍රේමය ඉස්මතු වන අවස්ථා දක්වමින් දෙවොන්දරා සංගේ සංවේදී බව ධ්වනිත වන චරිත නිරූපණයන් සහිත අවස්ථා, නිදසුන් දක්වමින් සාකච්ඡා කර තිබීම අපේක්ෂිතයි. (ලකුණු 15)

(06) නිර්දිෂ්ට කෙටිකතා තුනක් ඇසුරින් නිදසුන් දක්වා තිබීම අපේක්ෂිතයි. (ලකුණු 15)

(07) භාෂාවේ අර්ථ රසය මෙන් ම ශබ්ද රසය කුළු ගැන්වෙන කාව්‍යෝක්තීන් දක්වා නිර්දිෂ්ට පද්‍ය පන්ති තුනකින් හෝ නිදසුන් දක්වමින් ලියා තිබීම අපේක්ෂිතයි. (ලකුණු 15)

(08) රත්නාවලියේ ශෘංගාර රසය ඉස්මතුවන

මදන මහෝත්සවය

අනංග පූජා අවස්ථා

උදයන සාගරිකා හමුව ආදී අවස්ථා ද

මදන මහෝත්සවයේ වසන්තකගේ රංගන අවස්ථා

සැලලිහිණියා දකින වසන්තකගේ සංවාද අවස්ථා

රජු වයන්තක අතර සිදුවන සංවාද

සාගරිකා හමුවීමට යොදන ප්‍රයෝග ව්‍යර්ථ වී වාසවදත්තාගේ අතට ම රජු හා වසන්තක අසුවන අවස්ථා ආදියේදී මතුවන හාස්‍යෝත්පාදක බව නිදසුන් සහිත ව ලියා තිබීම අපේක්ෂිතයි. (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

13 ශ්‍රේණිය

## සිංහල - II

පිළිතුරු පත්‍රය

### I කොටස

(01) (ලකුණු 1 × 20 = 20)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (1) 3 | (2) 2 | (3) 3 | (4) 4 | (5) 2 | (6) 4 | (7) 3 |
| (8) 3 | (9) 1 | (10) 3 | (11) 2 | (12) 3 | (13) 4 | (14) 3 |
| (15) 5 | (16) 25 | (17) 4 | (18) 5 | (19) 1 | (20) 4 | |

### II කොටස

(02) (අ) (1) ශිල්ප ශාස්ත්‍ර දියුණු නොවීම.

(2) දකුණු ඉන්දීය ද්‍රවිඩ රජවරුන්ගේ පාලන බලය පැතිර යාම හේතුවෙන් හෙළ සමාජය තුළ ශිෂ්ටමනුෂ්‍යාත්වය පිරිහීම හා අධ්‍යාපනය බිඳවැටීම.

(3) සිංහල හෝ දමිළ හෝ යම්තම් ලිවීමට කියවීමට ප්‍රමාණවත් වූ ඉගෙනුමක් එකල විය.

(4) තුනකට පෙර

(5) ආගමික, යාගයෝමයන්ට අවැසි වූ නිසා නාට්‍ය ශිල්පය පමණක් ඉතිරි වන්නට එය හේතුවක් විය.

(ලකුණු 2×5 = 10)

(ආ) සාරාංශය වචන 55 60 අතර වීම ප්‍රමාණවත් ය. (ලකුණු 15)

(03) රචනා දී ඇති මාතෘකා අතරින් එක් මාතෘකාවකට අදාළ වන සේ කරුණු දක්වමින් යෝග්‍ය මාතෘකාවක්ද යොදා විශ්ලේෂණාත්මක ව ලිඛිත බසින් ව්‍යාකරණානුකූලව ලියා තිබීම අපේක්ෂිතය. (ලකුණු 25)

(04) (අ) (1) ඕ තොමෝ මිහිරි ලෙස ගී ගයමින් රංගනයක යෙදුණා ය.

(2) තම සුවදුක් බැලීමට දරුවන් පැමිණෙතැ'යි මහලු දෙමව්පියෝ සිතූහ.

(3) සියලු ජයග්‍රාහකයන් පිටිසර පළාත්වලින් පැමිණ ඇත.

(4) විදුහල්පතිතුමා පාසලේ අභිවෘද්ධිය උදෙසා කැපවීමෙන් කටයුතු කළේය.

(5) තම පුතුගේ ජයග්‍රහණය පිළිබඳව දෙමාපියෝ සතුටු වූහ. (ලකුණු 05)

(ආ) (1) වෛද්‍යවරුන් විසින් රෝගීහු සුවපත් කරනු ලබති / සුවපත් කෙරෙති / කෙරෙත්

(2) ඔවුන් විසින් දැරියක් පැහැරගන්නා ලද්දීය. / ලද්දාය, / පැහැරගැනිණි, / ගැනුණාය. / පැහැරගනු ලැබුවාය. / පැහැරගනු ලැබිණි.

(3) කම්කරුවා විසින් ලොරියට වී මලු පටවනු ලබයි. / ලැබෙයි / පටවනු ලැබේ. / පැටවෙයි.

(4) කිවිඳාණන් විසින් අපි පිනවන ලදිමු / පිනවුණෙමු / පිනවනු ලැබීමු / පිනවන ලද්දෙමු.

(5) බැතිමතුන් විසින් දේවපූජාවෝ කරනු ලබති / ලබත් / කරනු ලබන්නෝ ය / කෙරෙති කෙරෙත්.

(ලකුණු 05)

(ඉ) (1) මා (2) සැබෑ නායකයෙක් (3) පිනවයි. (4) ආරාධිතයන් (5) අප

(ලකුණු 05)

(05 × 03 = 15)

(05) (අ) (1) ප්‍රත්‍යන්ත ගම්මානයක

(2) විනාශ

(3) ඔටුනු පැළඳවීමේ උත්සවය (ලකුණු 03)

(ආ) (1) ප්‍රතිසංස්කරණය (2) තර්ජනය කිරීම (3) විරාගත (ලකුණු 03)

(ඉ) (1) ඒකාලෝක (2) ප්‍රධානෝත්සවය (3) අලෝකවත්

(4) ප්‍රදානෝත්සවය (5) සම්බන්ධතා (6) සබඳතා (ල. 1/2 × 6 = 03)

(ඊ) (1) සරණ පාද / විවාහ

(2) සර නාදය / විල / හැසිරෙන

(3) සක් හක්ගෙඩිය / ඇස් / රෝද

(4) නව අලුත් / නවන්න

(5) ගත ග්‍රන්ථය / ගත කිරීම

(6) මල පුෂ්පය / මල්ලි / මලපහ (ල. 1 × 6 = 06)

(ලකුණු 15)

(06) (1) තද්ධිත සමාස සන්ධි

(2) සන්ධි කෘදන්ත පූර්ව ක්‍රියා

(3) තද්ධිත මිශ්‍ර ක්‍රියා සමාස

(4) සන්ධි උපසර්ග නිපාත

(5) තද්ධිත කෘදන්ත උපසර්ග (ලකුණු 3 × 5 = 15)

(07) (අ) (1) දිවෙන් දිව ගාගෙන

(2) අඩු කළය සෙලවීම

(3) අතු කඩා මොර කෑම

(4) උපාසක බැළලුන් මීයන් ඇල්ලීම

(5) ආඬි හත් දෙනාගේ කැඳහැළිය වගේ

(6) උණ පුරුකේ ලූවත් බලුවලිගේ ඇදය නැරීම (ල. 1/2 × 6 = 03)

(ආ) (1) නිෂ්පල ක්‍රියාවක නිරත වීම (2) අකැමැත්තෙන් යමක් කිරීම.

(3) කිසිම බයක් සැකක් නොමැතිව යමක් කිරීම. (4) අවදානම් කටයුත්තක් අනුන් ලවා කරවීම.

(5) ප්‍රයෝජනවත් නොවන යමක් තෑගි දීම.

(6) (ල. 1/2 × 6 = 03)

(ඉ) (1) විරුද්ධාර්ථ යුගල පද (2) පද දෙකෙහිම අර්ථ රහිත යුගල පද

(3) සමානාර්ථ යුගල පද

(4) පළමු පදයේ අර්ථ ඇත. දෙවන පදයේ අර්ථ රහිත පදයකි.

(5) සමානාර්ථ යුගල පද (6) විරුද්ධාර්ථ යුගල පද (ල. 1/2 × 6 = 03)

(ඊ) (1) අඩමානයට (2) කුඩා කැලෑ රොද

(3) හිරිහැර කරනවා (4) මැලවෙනවා

(5) වැහිවලාකුළු (6) දුගඳ (ල. 1/2 × 6 = 03)

(උ) (1) මිදුල (විහාරවල) (2) රත්තරං කද (බුදු පුදට අයත් ආහාර ගෙනසන කද)

(3) පාවහන් (4) රෝගියා (ශාන්තිකර්මවලදී)

(5) කමතේ මැද හාරන වළ (6) වැසි සමඟ සුළං හැමීම (ල. 1/2 × 6 = 03)

(08) (1) සාම්ප්‍රදායික ක්‍රමයට අනුව පද බෙදා ලියා තිබිය යුතුයි.

(2) ශ්‍රව්‍ය ගෝචර / ග්‍රාම්‍ය

(3) වැවුණු / මසුන්

(4) ගැටය සහිත ඇලපිල්ල, ඉස්පිල්ල, හල්පිල්ල, කොම්බුව සහ හල්පිල්ල.

(5) ප්‍රාකෘත, කෘත්‍රිම (ලකුණු 3 × 5= 15)